## <u>මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව</u>

## <u>පුරප්පාඩු</u>

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **<u>තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර</u>**

අවශ්‍ය සුදුසුකම්:

1. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) [රසායනික හා ක්‍රියාවලි ඉංජිනේරු, විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු යන ක්ෂේත්‍රයන් සඳහා] හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම.

   හෝ

2. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

   හෝ

3. අදල විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

   හෝ

4. අදාළ විෂය ක්ෂේත්‍රයට අදලව වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය: රු. 35,145-7x355;9x495-42,085/-(මාසික) U-MT 1(II)
(17/2016(v) චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදලව)

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

**(අයදුම්පත බහාලන ලිපි කවරයෙහි ඉහළ වම් පස කෙළවරෙහි අයදුම් කරන අදාළ ක්ෂේත්‍රය සඳහන් කරන්න.)**

## 02. විනයාරක්‍ෂක නිලධාරි - II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්: (I) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

(II) වයස :අවුරුදු 30 -45 අතර විය යුතුය.

(III) ශාරීරික සුදුසුකම් : පිරිමි - උස-අඩි 5 අගල් 5ට නොඅඩු විය යුතුය. කාන්තා උස-අඩි 5 අගල් 4ට නොඅඩු විය යුතුය. පපුව -අගල් 32 (සාමාන්‍ය)

**සටහන :** පොලිස්/සන්නද්ධ හමුදා සේවා පසුබිමක් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු වලදී ක්‍රියාකාරී ලෙස සහභාගී වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

සන්නද්ධ හමුදා සේවයේ මේජර් තනතුරට නොඅඩු තනතුරක හෝ ශ්‍රී ලංකා පොලිසියේ ඒ හා සමාන වූ තනතුරකට නොඅඩු තනතුරක සේවා පළපුරුද්ද.

වැටුප් ක්‍රමය : රු.42885-18x660-54,765/-(මාසික)U-MN3 (II) [17/2016 (v)] චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදාලව

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

## 03. පරිපාලක (විදුලි) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්: I (අ) ජාතික තාක්‍ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (තුන් අවුරුදු පළපුරුද්ද ජාතික තාක්‍ෂණ සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයකු වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.31,625-7x300;10x355-37,275-(මාසික) U-MT 1(III ) (17/2016(v) චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදාලව)

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනුලැබේ.

04. විදුලි කාර්මික 11 ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්: (I) කියවීමට හා ලිවීමට හැකියාව

(II) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) දෝෂයන් සොයා ගැනීම, ද්‍රව්‍ය අළුත්වැඩියා කිරීම සහ නැවත සවි කිරීම, ට්‍රාන්ස්ෆෝමර් සහ සියළුම වර්ගවල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කේබල්, වයර් කම්බි සහ ඒවා වර්ග කිරීම, මිනුම් උපකරණ හා ඒවායේ භාවිතය, වයර් කම්බි ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මීටර් හා කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීම.

(ආ) ඇඳීමේ සහ රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාග වලින් මාන සටහන් තැබීම.

(ඇ) මෙම කාර්යයන්හිදී භාවිතා කරනු ලබන ආවුදවල ආරක්ෂාව සහ ඒවා පාවිච්චි කිරීම පිළිබඳ දැනුම තිබිය යුතුය.

(III) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.27,062-16x244-30,966/-(මාසික) U-PL3 (III) (2019 වර්ෂයට අදල වේ)
රු.29,915-16x270-34,235/-(මාසික) (2020 වර්ෂයට අදල වේ)

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.07.04 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ආයතන (අනධ්‍යයන) වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරී නමට ලිපිනය ලියූ රු.45.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මී.x 10 සෙ.මී. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2019.06.12